# 2008 බිඳ වැටීම හා එහි විප්ලවවාදී ඇඟවුම්

## පලමු වන කොටස

**The crash of 2008 and its revolutioary implications -- Part 1**

**නික් බීම්ස් විසිනි**
**2008 පෙබරවාරි 04**

*පහත පලවන්නේ ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජිකයෙකු වන නික් බීම්ස් විසින් 2009 ජනවාරි මාසයේ පවත්වන ලද සසප ගිම්හාන පාසැලට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පලමු වන කොටසයි. මෙහි 2,3, හා 4 කොටස් ඉදිරි දිනවල පලකෙරෙනු ඇත.*

මේ වාර්තාව ආරම්භයේ දී ම මා ඉල්ලා සිටින්නේ 2008 බිඳ වැටීම හා එහි විප්ලවවාදී ඇඟවුම් යන එහි ශීර්ෂ පාඨය වෙත සමීප අවධානය යොමු කරන ලෙසයි.

''විප්ලවවාදී'' යන වචනයේ යෙදීම ඔහේ අමතකවී යන යම් වර්ගයක පුරසාරමක් නොවේ. එය අරමුනු කර ගන්නේ ගෝලීය ආර්ථික අර්බුදයේ ඓතිහාසික ඇඟවීම් කෙරෙහි හා අප පක්ෂයට ඉන් මතු කෙරෙන වගකීම් කෙරෙහි අවධානය දිනාගැනීම යි.

මාධ්‍ය තුල 1930 ගනන්වල මහා අවපාතය අදාල කර ගත් බොහෝ දේ සඳහන් වී තිබේ. දැන් දිග හැරෙන්නේ එම අවධියෙන් පසුව එලඹ ඇති බරපතල ම ආර්ථික අර්බුදය බවට කිසිදු ප්‍රශ්නයක් නැත. එහෙත් යමෙකු ඓතිහාසික සාම්‍යයන් සොයන්නේ නම් මා සිතන පරිදි සඳහන් කල යුතු වන්නේ 1929 ට වඩා 1914 බවයි. 1914 ලෝක ධනේශ්වර පර්යායේ බිඳ වැටීම අත්දුටුවේ ය. එය ගත්තේ යුද්ධයක රූපාකාරය වුව ද, යුරෝපීය බලවතුන් අතර හටගත් යුද ගැටුමට යටින් පැවතියේ ඊට පූර්වයෙන් සාපේක්ෂ ස්ථාවරත්වය රැඳී පැවතුනාවූ ආර්ථික පදනම්වල බිඳ වැටීමයි.

1914 ධනවාදයේ බිඳ වැටීම විප්ලවවාදී අරගලයන්ගේ කාල පරිච්ඡේදයකට මග හෙලිකල නමුදු එවකට එය පෙනෙන්නට නොතිබුනු තරම් ය. ලෙනින්ගේ නම පවා දැන සිටියේ සාපේක්ෂව ගත්කල අතලොස්සක් දෙනා පමනි. 1915 දී විප්ලවවාදී තත්වයේ වෛෂයික උපාංග පරීක්ෂාවට භාජනය කල ඔහු ''තම තමන්ගේ'' පාලක පන්තීන්ට සහාය දැක්වීම සඳහා පෙල ගැසී සිටි සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ පාවාදීමට එරෙහිව යුද්ධය, සමාජවාදී විප්ලවය ඓතිහාසික න්‍යාය පත්‍රය මතට ගෙන ඇති බව අවධාරනය කලේ ය.

ධනවාදයේ බිඳ වැටීමක් හුදු ආර්ථික අර්බුදයක් පමනක් නොවේ. දශක ගනනාවක් ඉදිරියට සමාජයෙහි ඉරනම තීරනය කරන නව යුගයක ආරම්භය ඉන් සලකුනු කරයි. අපි එවන් යුගයකට එලඹ සිටින්නෙමු. 1914 වසර ධනේශ්වර පර්යායේ ප්‍රථම මහා බිඳ වැටීම සලකුනු කලේය. 2008 වසර දෙවැන්න සලකුනු කරයි.

2009 වසර ආරම්භ වී ඇත්තේ මෙම බිඳ වැටීමේ දේශපාලන ඇඟවුම් පිලිබඳ පැහැදිලි දර්ශනයක් ද සමග ය. ගාසාවට එල්ල කල බිහිසුනු ඊශ්‍රායල් ප්‍රහාරය හුදෙක් පලස්තීන ජනතාවට එරෙහි ආක්‍රමනික යුද්ධය තවත් දිග් ගැස්සීමක් පමනක් නොවේ. එය එලඹෙන කාල පරිච්ඡේදයේ ජාත්‍යන්තර සම්බන්ධතාවන්හි හා දේශපාලනයේ ස්වභාවය පිලිබඳ අනතුරු ඇඟවීමක් ද වේ.

සියොන්වාදී රාජ්‍යය ඉදිරියට තල්ලු කර ඇත්තේ ගෝලීය ආර්ථික අර්බුදය නිසා නව බලයක් ද සහිතව ඊශ්‍රායල් සමාජය ම ඇතුලත උත්සන්න කර තිබෙන පුපුරන සුලු ප්‍රතිසතිතා මඟින් ම නොවේ. සති ගනනාවක් ගෙන ගිය ගාසා ප්‍රහාරය, 1930 ගනන් හා 1940 ගනන් වල සිදුකල ගුවෙර්නිකා හා වෝර්සෝ ගැටෝව විරේක කිරීම වැනි දැවැන්ත අපරාධ සිහියට නංවන අතර, දැන් අප ඇතුල්වී සිටින ඓතිහාසික අවධියේ ස්වභාවය පිලිබඳව එය නොවරදින සලකුනකි.

බිහිසුනු ප්‍රහාරයට ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී රටවල ප්‍රතිචාරය, 1930 ගනන් වල ඇබිසීනියාවට එල්ල කල ඉතාලි ෆැසිස්ට් රාජ්‍යයේ ප්‍රහාරය කෙරෙහි ඔවුන්ගේ ආකල්පයට නොදෙවෙනි බව සිහියට නංවයි.

අගෝස්තු - සැප්තැම්බර් මාසවල ගෝලීය මූල්‍ය අර්බුදය එහි මුලු බලය සහිතව නැඟී ආ තැන් පටන්, ලෝක ධනේශ්වර ආර්ථිකය මුහුනපා ඇත්තේ හුදෙක් දැවැන්ත පාඩු හා මහා පසුබෑමකට පමනක් නොව ප්‍රාග්ධන සමුච්ඡයේ සමස්ත ක්‍රියාවලියේ ම බිඳ වැටීමකට බව පෙනෙන්නට පටන් ගෙන තිබේ.

තනතුරෙන් ඉවත්ව යන විට ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රයට දුන් සම්මුඛ සාකච්ඡාවක දී එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් කියා සිටියේ පසුගිය අගෝස්තුවෙන් පසුව අවස්ථා තුනක දී තමා ගෝලීය මූල්‍ය පද්ධතියේ බිඳ වැටීමක් පිලිබඳව බියෙන්

පසුවූ බවයි. එම අනතුර පහව ගොස් නැත. දෙසැම්බර් 21 දින ස්පාඤ්ඤ මහ බැංකු අධිපති මිගුවෙල් ෆර්නැන්ඩෙස් ඕර්ඩොනෙස් පුවත්පත් සාකච්ඡාවක දී, මහා අවපාතයෙන් පසුව අත් නොදුටු ආකාරයේ ''පූර්න'' මූල්‍ය දියවී යාමකට ලෝකය මුහුන දී සිටින බවට අනතුරු ඇඟවූයේ ය.

''අන්තර් බැංකු (නය) වෙලඳපොල ක්‍රියා විරහිතව ඇති අතර එය දුෂ්ට චක්‍රයන් පනගන්වා තිබේ: පාරිභෝගිකයන් පරිභෝජනය නතර කර, ව්‍යාපාරිකයන් කම්කරුවන් බඳවා ගැනීම අත්හිටුවා, ආයෝජකයෝ ආයෝජනය නොකර හා බැංකු නය නොදී සිටිති. කිසිවෙකුටත් ගැලවී යා නොහැකි පරිදි සියල්ල මුලුමනින් ම පාහේ පක්ෂඝාතවී තිබේ.''

බැන්ක් ඔෆ් ඇමරිකා විසින් මෙරිල් ලින්ච් බැංකුව අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අතර මැද ඇන හිටිය හොත් මූල්‍ය බිඳවැටීමේ නව වටයක් ඇරඹෙනු ඇතැයි යන භීතිය හමුවේ දැන් එය ඉදිරියට ගෙනයාමට නම් ආන්ඩුවෙන් තව තවත් අරමුදල් අවශ්‍යවන බවට ආරංචි පැතිර යමින් තිබේ.

ආර්ථික හා මූල්‍ය ක්ෂේත්‍රයේ සෑම තොරතුරක්ම පෙන්නුම් කරන්නේ ගෝලීය අර්බුදය ගැඹුරු වන බවය. මේ තාක් දුරට එක්සත් ජනපදයේ නිවාස ක්ෂේත්‍රයෙහි සමස්ත මූල්‍ය අලාභය ඩොලර් ට්‍රිලියන 4 ක් හා කොටස් වෙලඳපොලවල අලාභය ට්‍රිලියන 9 ක් බවට ගනන් බලා ඇත.

ජනවාරි 3 දින *වොෂින්ටන් පෝස්ට්* පත්‍රය වාර්තා කලේ මේ වසර තුල පමනක් එක්සත් ජනපදයේ ජාතික නය ට්‍රිලියන 2 ක් තරම් ප්‍රමානයකින් ඉහල නඟිනු ඇති බවත්, නයෙන් විශාල කොටසකට වග කියන විදේශ ආයෝජකයන් කොතෙක් කල් අරමුදල් සපයනු ඇත්ද යන ප්‍රශ්නය මතු කෙරෙන බවත් ය. වර්තමානයේ එක්සත් ජනපද භාන්ඩාගාර බිල්පත් සඳහා දැඩි ගෝලීය ඉල්ලුමක් පැවතීම ම බියෙන් තැතිගත් ලෝක මූල්‍ය වෙලඳපොලවල ප්‍රකාශනයක් වන නමුත් මෙය කොතෙක් කල් පැවතිය හැකි ද යන්න කිසිවෙකුත් නොදනියි. ඉහත වාර්තාවෙහි සඳහන් කල එක් විශ්ලේෂකයෙකුට අනුව ''කොතැනක හෝ කාල බෝම්බයක් තිබෙන නමුත් එය සවිකර ඇත්තේ කොතැනදැයි අපි නොදන්නෙමු.''

වඩාත්ම මෑත ගනන් හිලව් වලට අනුව ඩොලර් ට්‍රිලියන 10.7 වන එක්සත් ජනපදයේ මුලු නයෙන් ට්‍රිලියන 3 ක් පමන විදේශ ආයෝජකයන් සතුය. මෙම ප්‍රාග්ධනයෙන් සැලකිය යුතු ප්‍රමානයක් ඉවතට ගලා ගියහොත් එය මූල්‍ය බිඳ වැටීමකට තුඩු දෙනු ඇත. ආර්ථික පර්යේෂනයේ ජාතික බියුරෝවට අනුව 2007 දෙසැම්බර් මාසයේ ආරම්භ වූ එක්සත් ජනපදයේ ආර්ථික පසුබෑම දැනට පශ්චාත් යුද්ධ සාමාන්‍යයට වැඩි මාස 12 ක් දිගට ඇදී ඇති අතර, 2009 අප්‍රේල් දක්වා පැවතුන හොත් එය යුද්ධයට පසු කාලයේ දිගු ම පසුබෑම වනු ඇත. 1945 වසරෙන් පසුව රැකියා අහිමි වූ නරකම වසර බවට පත් වෙමින් 2008 තුල අහිමි වූ රැකියා ප්‍රමානය දෙසැම්බර් මාසය වන විට, මිලියන 2.6 කට නැගුනි. සැප්තැම්බරයේ 403,000 ක් ද, ඔක්තෝබරයේ 320,000 ක් ද, නොවැම්බරයේ 533,000 ක් හා දෙසැම්බරයේ 524,000 ක් ද වශයෙන් වැඩිම ප්‍රමානයක් රැකියා අහිමිවූයේ පසුගිය සිව් මස තුලය.

එක්සත් ජනපදයේ හා ලෝකය පුරා නිෂ්පාදන කර්මාන්තයේ දත්ත පෙන්නුම් කරන්නේ වේගවත් වන වැටීමකි. එක්සත් ජනපදයේ සැපයුම් කලමනාකරන ආයතනය වාර්තා කලේ දෙසැම්බර් මස එහි දර්ශකය, 1980 ජූනි මාසයේ සටහන්වූ එහි පහතම මට්ටම වූ 30.3 හා සසඳන කල ඒකක 32.4 කට වැටුනු බවය. අලුත් ඇනවුම් එක දිගට 13 වන මාසයටත් පහල ගිය අතර දැන් එය වාර්තා තැබීමට පටන් ගත් 1948 ට පසුව පහලම ලක්ෂයට ලගාවී ඇත.

යුරෝපයේ දී සමීප ලෙස නිරීක්ෂනය කරන මෙම දර්ශකය දෙසැම්බරයේ දී ඊට පෙර මාසයේ තිබූ 35.6 සිට 33.9 දක්වා වැටුනි. මෙම සංඛ්‍යාව 50 වඩා පහල ගිය විට සලකන්නේ හැකිලීමක් ලෙසය. ආසියාව සම්බන්ධයෙන් ද කථාන්තරය එකම ය. ජපානය හා කොරියාව යන දෙරට ම තියුනු ලෙස හැකිලී යාම් වාර්තා කරයි. මෝටර් රථ කර්මාන්තයේ මිනුම් දන්ඩ ලෙස සලකන ටොයෝටා සමාගම අප්‍රේල් මාසයෙන් අවසන් වන වර්ෂය සඳහා ප්‍රථම වතාවට අලාභයක් වාර්තා කිරීමට නියමිතව ඇත. මාස කිහිපයකට පෙර පසුබෑමකට ඇද වැටීමෙන් ලෝකය ගලවාගන්නේ යයි සලකන ලද චීනය ඊනියා ''වෙලඳපොල විවෘත කිරීමෙන්'' පසුව වාර්තාවූ ඉතා බරපතල පසුබෑමකට මුහුනපා ඇත. නිෂ්පාදන අංශය තුන්වන මාසයටත් හැකිලී ගිය අතර ආර්ථික වර්ධනය, සමාජ ස්ථාවරත්වය සඳහා අවශ්‍ය අවම මට්ටම ලෙස චීන තන්ත්‍රය විසින් සලකන සියයට 8-9 මට්ටමටත් බොහෝ පහල සියයට 5.5 අගයක් කරා වැටී තිබේ.

ජේපී මෝර්ගන් පර්යේෂන වාර්තාව මෙසේ සඳහන් කරයි: ''පශ්චාත් දෙවන ලෝක යුද්ධ අවධිය තුල ගෝලිය දල දේශීය නිෂ්පාදනය තියුනු ම ලෙස පිට පිට කාර්තු හතරක පිරිහීමක් වාර්තා කිරීමට යන බවක් පෙන්නුම් කරන ගැඹුරු ගෝලීය හැකිලීමක් මධ්‍යයේ අපි පසුවන්නෙමු.'' ලෝකයේ ප්‍රමුඛ රටවල් තුනෙහි ම (ජී-3) වර්ධනයේ සාමාන්‍යය සියයට 5 න් පහත බැස ඇතැයි එය ගනන් බලයි.

මෙම අඳුරු වාතාවරනය හමුවේ එය ම ප්‍රීතියට කාරනයක් සේ සැලකීමට උත්සාහ දැරීමක් ලෙස *ෆිනැන්ෂල් ටයිම්ස්* පත්‍රය නව වසර ආරම්භ කලේ ''1989 පොහොසත් උරුමය මත ඇඳීම'' යන කතුවැකි සිරස්තලයකිනි.

''ඉස්ලාමීය ත්‍රස්තවාදය, ගෝලීය උනුසුම්වීම හා මූල්‍ය අර්බුදය මඟින් සැහැසි ලෙස අධිකාරවත්වූ දශකයක් තුල, යුරෝපයේ කොමියුනිස්ට්වාදය බිඳ වැටී ලෝකය දීප්තිමත් අනාගතයකට හරිබරි ගැසෙන බව පෙනී ගිය 1989 දී ඔලුවට ගසන ලද දවස් මතකයට නගා ගැනීම දුෂ්කර කාර්යයකි.

''සතුටට කාරනය එම අරුනෝදය ජීවමානව පැවතීමට නියමිත වීමයි'' යනුවෙන් ලියුවේ ප්‍රන්ස විප්ලවය පිලිබඳව වර්ඩ්ස්වර්ත් ය. ඔහුගේ සිතුම් පැතුම් 20 වසරකට පෙර බර්ලින් තාප්පය බිඳ දැමීමට ද, නැගෙනහිර යුරෝපයේ සෝවියට් පාලනය පෙරලාදැමීමට හා ඉන් පසුව සෝවියට් සංගමය බිඳ විසුරුවීමට සහභාගී වූ මිලියන ගනනක් දෙනා ප්‍රතිරාවය කලහ.''

''ආර්ථික ප්‍රති ව්‍යුහකරනය මිනිසුන්ගේ ජීවිත හරහා ගමන් කරමින් එය ඉරා දමන විට ප්‍රීති ප්‍රමෝදය, මිත්‍යාවෙන් බිඳීමට ඉඩ සලසමින් පලාගිය'' බව පිලිගැනීමට සැබවින්ම කතුවැකියට බලකෙරුනි. ''කෙසේ වෙතත් සෝවියට් සංගමය විනාශවීමේ අතීතය සමඟ සැමරීමට තව මත් යමක් ඉතිරිව තිබීම'' ඉදිරි කාලයටත් උත්තේජනයක් බව එය තවදුරටත් කියා සිටියි.

''විසි වසරක් යනු සුව පහසු සංවත්සරයකට වඩා වැඩි දෙයකි. ලෝක ආර්ථික අර්බුදය පැරනි කොමියුනිස්ට් යුරෝපයට තදින් පහර දීමත් සමඟ ඉන් සලකුනු කලේ යුගයක අවසානයයි. දැනට නම් බටහිර සන්ධානය එහි නැගෙනහිරට විහිදීමේ සීමාවට පැමින සිටියි. තවදුරටත් විහිදීම කෙරෙහි රුසියාව අවශ්‍ය නම් බලය යොදාගැනීම මඟින් ප්‍රතිරෝධය දක්වනු ඇත. එහෙත් ආන්ඩු ආර්ථික කලබැගෑනිය සමඟ පොර බදමින් සිටියි. තම අනාගතය සැලසුම් කිරීමට අරගලය කරන අතරතුර දී ඔවුන් 1989-2009 උරුමය සුරක්ෂිත කර ගැනීමට උත්සුක වනු නියත ය. කාල වකවානු නිතරම ඇඩි ස්වභාවයක් ගන්නා බව සැබවි. එහෙත් කලාපයේ වැඩි කොටසක පැතිර ඇත්තේ ප්‍රගතිය පිලිබඳ අවබෝධයයි. මෙම අවබෝධය එලඹෙන දුෂ්කර වසරවල දී පහව නොයනු ඇත.''

කුනාටු සහිත එලඹෙන කාලය සඳහා පුවත්පතට සිය පාඨකයන් වෙත පිලිගැන්වීමට ඇත්තේ ''1989 උරුමය'' පමනක් වීමේ කාරනය, ධනේශ්වරය මෙම ගෝලීය අර්බුදයට මුහුනපා සිටින තත්වය තුල මුහුනපාන සැලකිය යුතු ආතතිය ගැන නොකීවත් විශ්වාසය හා ඉදිරිදර්ශනයක් නොමැතිකම පිලිබඳ සලකුනකි. මනා හේතු සාධක සහිතව ම ලෝක ආර්ථික අර්බුදය පසුගිය දශක දෙක තුල ගොඩනගන ලද දැවැන්ත ආර්ථික ව්‍යුහයන් හරහා කැපීගොස් ඇතුවා පමනක් නොව ලෝකය පුරා ආන්ඩුවල දෘෂ්ටිමය පදනම සකස්කල නිදහස් වෙලඳපොල ලබ්ධිය ද සුනු විසුනු කර තිබේ.

1989 සැබෑ උරුමය ඇත්තේ ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රය එය සොයන තැන නොවේ. එය රැඳී ඇත්තේ ගෝලීය ආර්ථික හා මූල්‍ය අර්බුදය තුලම ය. සීතල යුද්ධ පර්යායේ අවසානය ගෝලීය ධනවාදයට සීමාසහිත කෙටිකාලීන තල්ලුවක් සපයා දුන් නමුදු, දිගු කාලයේ දී දායක වී ඇත්තේ ඒ තුල ඇති සියලු පරස්පර විරෝධයන් මුදා හැරීමටය.

ජනවාරි 7 වන දින වර්ෂයේ සිය පලමු කොලම ලිවීමේ දී පත්‍රයේ ආර්ථික විශ්ලේෂක මාටින් වුල්ෆ් යම් ආකාරයක වෙනත් නැම්මක් ගෙන ඇත.

''2009 සාදරයෙන් පිලිගනිමු. පරම්පරා ගනනාවක් සඳහා ලෝක ආර්ථිකයේ ඉරනම තීරනය කරන වසර මෙය විය හැකිය. සමහරු මෙම දශකයේ මැද වසරවල අත් කර ගත් ගෝලීයව අසමතුලිතවූ ආර්ථික වර්ධනය යලි පිහිටුවාගත හැකිය යන අපේක්ෂාවෙන් පසුවෙති. ඔවුන් වැරදි ය. අපගේ මනාපය එය ඌනපූරනය කරන්නේ කුමක් මත ද යන්න ගැනයි. එය ලෝක ආර්ථිකයේ මනා තුලනයක් හා බිඳී විසිරීයාම යාම අතර පවතින්නකි. එම මනාපය කල් නොදැමිය හැකිය. එය මේ වසර තුල අත්කර ගත යුතුය.

''අප සිටින්නේ දශක හතකට පසුව එලඹි වඩාත්ම තීරනාත්මක ගෝලීය මූල්‍ය අර්බුදයේ ග්‍රහනයෙහිය. එහි ප්‍රතිපලයක් ලෙස නය ගැනීමට සුදුසුකම් ඇති, මහා පරිමානයේ, අභිලාෂවත් පුද්ගලික නය ගැනුම්කරුවන්ගේ හිඟයකට ලෝකය මුහුනපා සිටියි. දැවැන්ත එක්සත් ජනපද මූල්‍ය හිඟයන් හා මධ්‍යම බැංකුවේ නය ප්‍රසාරනය මත විකල්ප වශයෙන් රැඳී සිටීම වනාහි තාවකාලික එහෙත් අවශ්‍ය උපාය මාර්ගයකි. එහෙත් එය වර්ධනය සඳහා කල් පවතින ප්‍රතිලාභ ගෙන නොදෙනු ඇත. අතිමූලික වෙනස්කම් අවශ්‍ය කෙරේ.''

වෙනත් වචනවලින් කිවහොත් ලෝක ධනවාදය මුහුනපා සිටින ගැටලුව වනාහි දැවැන්ත අලාභයන් අත් විඳීම නොව සමස්ත සමුච්ඡයකරන ක්‍රියාවලිය ම බිඳ වැටී තිබීමයි. කෙසේ වෙතත් ''මනාව තුලනය කල ලෝක ආර්ථිකයක්'' සඳහා වන වුල්ෆ්ගේ කැඳවුම සාක්ෂාත් කල නොහැක්කකි. සැබෑ අසමතුලිතතාවය ඇත්තේ ඊනියා හිඟයන් සහිත රටවල් හා චීනය වැනි අතිරික්තයක් සහිත රටවල් අතර නොවේ. එය ඊට වඩා ප්‍රාථමික දෙයකි. අසමතුලිතතාවය ආර්ථික පද්ධතියේ හදවත කරාම ගමන් කරයිඃ එය ගෝලීය ආර්ථික පද්ධතිය පුරාම සිදුවන දැවැන්ත ව්‍යාජ ප්‍රාග්ධන සමුච්ඡයකරනය හා එය තිරසාර කිරීම සඳහා අවශ්‍ය කෙරෙන අතිරික්ත වටිනාකම් සමුදාය අතර ප්‍රශ්නයකි. මෙම අසමතුලිතතාවය විසඳිය හැක්කේ එක්සත් ජනපදයේ පටන් යුරෝපය හා චීනය ද ඉන්දියාව හා අවශේෂ ඊනියා ''නැගීඑන'' ආර්ථිකයන් දක්වාත්, එනම් ලෝකය පුරා කම්කරු පන්තියට ආර්ථික විනාශය

ලඟාකර දෙන ප්‍රාග්ධනයේ විශාල පදාසයන් අතුගා දැමීම මඟින් පමනකි.

*ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පත සමඟ ජේපී මොර්ගන් චේස් හි ප්‍රධාන විධායක ජේමී ඩිමෝන් පැවැත්වූ සාකච්ඡාවක දී අනතුරු අඟවා තිබුනේ තවදුරටත් ඉදිරියේ ඇතිවන ගැටලු පිලිබඳව පමනක් නොව බිඳ වැටීමේ වඩාත් දුර දිග යන ප්‍රතිවිපාකයන් පිලිබඳව ය. ''නය මත කෙරෙන ඉහල මට්ටමේ වත්කම් මිලට ගැනීම් හා සුරක්ෂිතකරනය වැනි ක්ෂේත්‍රයන්හි කාර්මික අතිරික්තයන් දෙස ආපසු හැරී බලන විට පැහැදිලි වන්නේ එම වෙලඳපොලවලින් සමහරක් පැරනි තත්වයට යලි නොපැමිනෙනු ඇති බවය''යි ඔහු පැවසීය. එහෙත් පසුගිය 20 වසර තුල එක්සත් ජනපදයේ හා ලෝක ආර්ථිකයේ ප්‍රසාරනයෙහි ලා ඒ සා තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටුකර ඇත්තේ හරියට ම මෙම ආර්ථිකයන්ම ය.

මෙම වාතාවරනය හමුවේ යම් ආකාරයකට දෙදරා ගිය 1989 උරුමය බදාගෙන *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රය කතුවැකි ලියන අතර තුර පසුගිය දශක දෙකෙහි සිදුවීම් පෙන්නුම් කරන්නේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ විශ්ලේෂනය බලගතු ලෙස සනාථවීමකි. ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳ වැටීම සලකුනු කරන්නේ ධනේශ්වර සංවර්ධනය සඳහා නව මාවත් විවෘත වීමක් වෙනුවට සමස්ත ලෝක ධනවාදී පර්යායෙහි ම ඓතිහාසික අර්බුදයක් පිලිබඳ ආරම්භක ප්‍රකාශනය බව කියා සිටියේ අපේ ව්‍යාපාරය ම පමනකි.

මෙය මා පසුව සවිස්තරාත්මකව සමාලෝචනය කරන්නෙමි. එහෙත් දැනට පසුගිය වසරේ සිදුවීම් මාක්ස්වාදී විධික්‍රමයේ බලය පෙන්නුම් කරන්නේය යන කාරනයට අවධානය යොමුකිරීමට ඉඩ දෙන්න.

වසරකට පෙරාතුව එනම් 2008 ජනවාරියේ මෙම සිඩ්නි නුවර පැවැත්වූ අපගේ රැස්වීමේ දී *ලෝක ධනේශ්වර පද්ධතියේ දේශපාලන හා ආර්ථික අර්බුදයත් සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරිදර්ශනය හා කර්තව්‍යයන් පිලිබඳ සටහන්* යන ඩේවිඩ් නොර්ත් විසින් රචිත ලියවිල්ල සාකච්ඡා කලෙමු. එය 2008 ජනවාරි 11 දින *ලෝක සමාජවාදී වෙබ් අඩවියෙහි* පලකරන ලදී.

එහි මෙසේ සඳහන් විය. ''2008 වසර අංගලක්ෂිත වනු ඇත්තේ ලෝක ධනේශ්වර පද්ධතියේ දේශපාලන හා ආර්ථික අර්බුදය සැලකිය යුතු තරමින් උත්සන්න වීම මඟිනි. ලෝක මූල්‍ය වෙලඳපොලවල කලබැගැනිය හුදෙක් සහ සම්බන්ධ පහත වැටීමක ප්‍රකාශනය නොව දැනටමත් ජාත්‍යන්තර දේශපාලනය අස්ථායී කර තිබෙන පද්ධතිමය අවුලකි. ගෝලීය ධනවාදයේ නිශ්චිත හා ආපසු නොහැරවිය හැකි ජයග්‍රහනය ඇඟවුම් කරන්නේ යයි කියනු ලැබූ සිද්ධියක් වූ සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් 16 වසරක් ගෙවුනු තැන, ලෝක ආර්ථිකය මස් මඩුවක ස්වභාවය ගෙන තිබේ. අවමුඛ උකස්කරයන්හි අපාලිත සමපේක්ෂන ආයෝජනයන් මඟින් තෙල් ඉසින ලද එක්සත් ජනපද නිවාස වෙලඳපොල බුබුල පුපුරා යෑමේ ප්‍රතිපලය වී ඇත්තේ ජාත්‍යන්තර බැංකු හා අනෙකුත් මූල්‍යායතනවලට ඩොලර් බිලියන සිය ගනනින් අලාභ සිදු වීමයි. මෙහි ප්‍රතිපලය, එක් විශ්ලේෂකයෙකුගේ වචනවලට අනුව ඇන්ග්ලෝ-ඇමරිකානු ධනේශ්වර පද්ධතියේ ශක්‍යතාවය හා නීතියුක්ත භාවය ප්‍රශ්නයට බඳුන්කල, ජාත්‍යන්තර මූල්‍ය අර්බුදයකි.''

2008 වසරේ එම රැස්වීමට ම ඉදිරිපත් කල මාගේ වාර්තාවෙහි එක්සත් ජනපද මූල්‍ය අර්බුදය හා චීනයේ ද අනෙකුත් අඩු දියුනු රටවල ද ආර්ථික ප්‍රසාරනය වෙන් වෙන් සිදුවීම් නොව එකම ක්‍රියාවලියක වෙනම අංශයන් බව මම පෙන්වා දුනිමි.

''වචන කිහිපයකින් කිවහොත්, අනෙකුත් රටවල් ද සමඟ චීන වර්ධනයේ ප්‍රසාරනය, එක්සත් ජනපදයේ නයෙහි දැවැන්ත වර්ධනයකින් තොරව සාක්ෂාත් කල නොහැකිය. එක්සත් ජනපද ආර්ථිකය මෙන්ම ගෝලීය ඉල්ලුම ද තිරසාර කර ඇති නයෙහි මෙම වර්ධනය දැන් තුඩුදී ඇත්තේ අර්බුදයකටය.''

පසුගිය වසරේ මෙම කාලය වන විට මූල්‍ය අර්බුදය හිස ඔසවා තිබුනු බැවින් එවන් නිගමනවලට එලඹීම දුෂ්කර නොවනු ඇතැයි සැබවින්ම යමෙකුට තර්ක කල හැකිය. එබැවින් අපි තවත් පස්සට ගොස් බලමු.

2000-6-5 දින රැස්වීමකට ඉදිරිපත් කල වාර්තාවක ව්‍යාජ ප්‍රාග්ධනය වර්ධනය වීමේ ඇඟවුම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුනු මම ගෙනහැර දැක්වීමි.

''කතෝලික ආගමේ පූජකවරුන්ට අනුව ආත්මය ශරීරයෙන් ඉවත්ව දිව්‍ය ලෝකයේ ලැගුම් ගනියි. වෙලඳපොලේ නායක පූජකයන් ද එවන් ධර්මතාවක් දේශනා කරයි. ඔවුන් කියන්නේ මුදල නිෂ්පාදන ක්‍රියාවලියෙන් වෙන්වී ගැනීමේ ස්වයං හැකියාවකින් යුක්ත වන බැවින් නිමක් නැතිව මුදල්වලින් මුදල් උත්පාදනය කරන මූල්‍යමය දිව්‍යලෝකයට පිවිසෙන බවයි.

''මුදල්වලට නිමක් නැතිව තව තවත් මුදල් බවට හැරවී ගැනීමේලා ප්‍රාග්ධනයට ඇති සිහිනය සැබෑ කර ගැනීමේ හැකියාවක් තිබේ ද? එසේ නැත්නම් මෙම ක්‍රියාවලියට ආවේනික සීමාසහිතකම් තිබේ ද? කොටස් වටිනාකම් අඛන්ඩව ඉහල නඟිමින් කොටස් හුවමාරුවේ දී ලාභ ලැබිය හැක්කේ වෙලඳපොලට තව තවත් ප්‍රාග්ධනය ගලා එන තාක් දුරට පමනකි. වෙනත් වචනවලින් කිවහොත් ආදායම් හා ලාභ සමුච්චය කල හැක්කේ පිරමීඩ ව්‍යාපෘතියක හෝ පොරෙන්දු නෝට්ටුවල ස්වරූපයෙන් ය.

''කෙසේ වෙතත්, ව්‍යාජ ප්‍රාග්ධනය නොකඩවා ඉහල නගිමින් නිෂ්පාදන ප්‍රාග්ධනය අඟුටු මිටි බවට පත්කරන කල ව්‍යාජ ප්‍රාග්ධනයට එහි සම්භවයෙන් පලා යා නොහැකිය. එක්තරා අවස්ථාවක දී එය අතිරික්තයට හිමිකම් කීමේ කාරනයට මුහුන පායි. මෙම අතිරික්ත වටිනාකම උපුටාගත යුත්තේ කම්කරු පන්තිය වෙතිනි. මෙම ඉල්ලීම් අවසාන වශයෙන් සපුරාලිය යුතු, නිෂ්පාදන ප්‍රාග්ධනයට සම්බන්ධිත (ලාභය) කොටසකට, ව්‍යාජ ප්‍රාග්ධන ස්කන්ධය පිම්වලින් වැඩිවන හිමිකම් ඉදිරිපත් කරන විට, ගෝලීය ධනවාදයේ ව්‍යුහය එන්ට එන්ටම ගනු ලබන්නේ උඩු යටිකුරු කල පිරමිඩයක රූපයයි.''

ඊට අට වසරකට පසුව හටගෙන ඇති මූල්‍ය අර්බුදය, මතුපිටට පුපුරාආ යුතු බව එවකට එම වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. ''ගෝලීය ප්‍රාග්ධනයේ මෙම උඩු යටිකුරු කල පිරමිඩාකාර ව්‍යුහය, එම ප්‍රාග්ධනයේ ආන්තික අස්ථාවරත්වය පිලිබඳ මූලාශ්‍රයයි. ඩොලර් බිලියන සිය ගනනක ප්‍රාග්ධනය එහි ප්‍රතිලාභ අනුපාතිකය තිරසාර කිරීමේ උත්සුකයෙන් ලාභ සොයාගෙන ලෝක වෙලඳපොලවල් සිසාරා ගමන් කරයි.

''තොග, බැඳුම්කර හා නිශ්චල දේපල වැනි දේපල වර්ගයන්ගේ මිල ගනන් ඉහල නගිද්දී අඩු මිලට ගෙන වැඩියෙන් විකිනීම මගින් ලාභ ලැබීමේ අරමුන ඇතිව ප්‍රාග්ධනය ගලා එයි. හිරු බබලද්දී සෑම කෙනෙක්ම වාසි ලබයි. එහෙත් වෙලඳපොලවල් කොර ගහන කල ද, ප්‍රාග්ධන වටිනාකම් බෙහෙවින් පුම්බා ඇති බව පෙනෙන්ට පටන් ගත් කල ද, පලායාම මහා ගාලගෝටියක ස්වරූපය ගන්නා අතර ව්‍යාජ ප්‍රාග්ධනයේ පමනක් නොව නිෂ්පාදන ප්‍රාග්ධනයේ ද ප්‍රාග්ධන වටිනාකම් එක් රැයකින් විනාශවී යයි.

**මතු සම්බන්ධයි**

© www.wsws.org